# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2014 අංක 26 දරන කාලාවරෝධ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2014 අගෝස්තු මස 08 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2014 අගෝස්තු මස 08 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 15.00 යි.**

## 2014 අංක 26 දරන කාලාවරෝධ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2014 අගෝස්තු මස 08 වැනි දින]

එල්. ඩී.—ඕ. 28/2013.

**(68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2014 අංක 26 දරන කාලාවරෝධ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. කාලාවරෝධ ආඥාපනතේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— 68 වන අධිකාරයේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"මෙම ආඥා පනත රාජ්‍යයට හෝ වෛවාහික කාරණාවලට බලනොපෑ යුතු බව.

15. මෙහි ඇතුළත් කිසිවක්, යම් ආකාරයකින්,

(අ) රාජ්‍යයේ අන්සතු කළ හැකි හෝ අන්සතු කළ නොහැකි අයිතිවාසිකම්වලට බලනොපෑ යුතු ය; තව ද,

(ආ) දික්කසාදය සඳහා වන යම් නඩු කටයුත්තක යම් නීති කෘත්‍යයන්ට හෝ යම් රජයේ නිලධරයකුට හෝ වෙනත් තැනැත්තකුට එරෙහිව නඩු කටයුතු ආරම්භ කළ යුතු කාලපරිච්ඡේදය විධිමත් කිරීම සහ නිශ්චය කිරීම සඳහා විශේෂ විධිවිධාන සලසා ඇති හෝ මින්පසු විශේෂ විධිවිධාන සලස්වනු ලබන හෝ යම් කරුණකට අදාළ නොවිය යුතු ය.".

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.